කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - පළමු වසර
සෙමෙස්තර අවසාන පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2023/2024
**DMG 1101: ප්‍රජාවිද්‍යාව පිළිබඳ හැඳින්වීම**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය. කාලය: පැය දෙකයි (02)
මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

---

1. අ) 'ජනගහන මූලිකාංග' සහ 'ප්‍රජාවිද්‍යාත්මක සංරචක' යන සංකල්ප නිර්වචනය කර, ඒ දෙක අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) ඔබේ උපාධිය සඳහා හැදෑරිය හැකි විෂයන් තුනක් (03) තෝරාගෙන, එම විෂයන් සහ ප්‍රජාවිද්‍යාව අතර ඇති අන්තර් සම්බන්ධතාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

2. අ) සම්භාව්‍ය ප්‍රජාවිද්‍යා සංක්‍රාන්ති න්‍යායේ අවධීන්වලින් පහැදිලි කරන ආකාරයට මර්ත්‍යතා සහ සඵලතා සංක්‍රාන්තිය සිදුවන ආකාරය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 06)

ආ) තෝරාගත් වර්ෂවල 'X' නැමැති රටෙහි ජනගහනය සම්බන්ධ දත්ත පහත දක්වා ඇත.

| | |
|---|---|
| මධ්‍ය වාර්ෂික ජනගහනය (2021) | 23,478,202 |
| මධ්‍ය වාර්ෂික ජනගහනය (2011) | 21,571,304 |
| සජීවී පුරුෂ උපත් (2021) | 181,021 |
| සජීවී ස්ත්‍රී උපත් (2021) | 173,080 |
| ස්ත්‍රී මරණ (2021) | 99,065 |
| පුරුෂ මරණ (2021) | 164,200 |
| වයස අවුරුදු 1 ට වඩා අඩු ජනගහනයේ මරණ | 799 |
| වයස අවුරුදු 15-49 අතර ස්ත්‍රීන් | 5,366,800 |
| වයස අවුරුදු 0-1 අතර පුරුෂයින් | 180,911 |
| 2011 - 2021 අතර ශුද්ධ සංක්‍රමණය | (-) 435,800 |

ඉහත දත්ත භාවිතා කර 'X' නැමැති රට සඳහා පහත සඳහන් මිනුම් ගණනය කරන්න.

I. දළ උපත් අනුපාතිකය -2021
II. දළ මරණ අනුපාතිකය -2021
III. මුළු සජීවී උපත් සංඛ්‍යාව -2021
IV. ළදරු මරණ අනුපාතිකය -2021
V. උපතේදී පුම්තිරි අනුපාතය -2021
VI. සාමාන්‍ය සඵලතා අනුපාතිකය -2021
VII. ස්වභාවික වර්ධනය - 2011-2021

(ලකුණු 14)

3. අ) 'ළමා යැපුම් අනුපාතය', 'මහලු යැපුම් අනුපතය' සහ 'මුළු යැපුම් අනුපාතය' පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) රටක වයස් සංයුතිය හඳුනාගැනීම වැදගත් වන හේතු හතරක් (04) සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

4. අ) 2012 ශ්‍රී ලංකා ජන හා නිවාස සංගණනයේ දී අභ්‍යන්තර සංක්‍රමණය හඳුනාගැනීම සඳහා භාවිත කළ ප්‍රශ්න දක්වා, මෙම ප්‍රශ්නවල එක් (01) දුර්වලතාවක් පෙන්වා දෙන්න.

(ලකුණු 06)

ආ) වසර 2021 සඳහා පහත වගුවේ දී ඇති දත්ත දිස්ත්‍රික්ක පහක් (A, B, C, D, E) පමණක් ඇති 'Y' නම් රටට අදාල වේ.

| උපන් දිස්ත්‍රික්කය | සාමාන්‍ය පදිංචි දිස්ත්‍රික්කය | | | | |
|---|---|---|---|---|---|
| | A | B | C | D | E |
| A | 1,799,345 | 11,907 | 3,501 | 3,303 | 502 |
| B | 83,102 | 1,235,687 | 36,404 | 12,101 | 804 |
| C | 17,305 | 54,222 | 2,844,352 | 8,509 | 122 |
| D | 69,534 | 25,657 | 40,400 | 3,900,102 | 1,202 |
| E | 31,304 | 1,308 | 15,012 | 8,851 | 1,240,574 |

ඉහත දත්ත භාවිතා කර, පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. A දිස්ත්‍රික්කයේ උපන් පුද්ගලයින් ප්‍රමාණය කොපමණද?
II. B දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලයින් ප්‍රමාණය කොපමණද?
III. C දිස්ත්‍රික්කයේ ශුද්ධ සංක්‍රමණ ප්‍රමාණය කොපමණද?
IV. රටෙහි ජීවකාලීන අසංක්‍රමණිකයින් ප්‍රමාණය කොපමණද?
V. විශාලතම ඇතුළු සංක්‍රමණ සහිත දිස්ත්‍රික්කය කුමක්ද?
VI. සංක්‍රමණිකයින්ට අඩුම ආකර්ශනයක් ඇති දිස්ත්‍රික්කය කුමක්ද?
VII. වැඩිම ජනගහනයක් ඇති දිස්ත්‍රික්කය කුමක්ද

(ලකුණු 14)

5. පහත දී ඇති සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

I. ජනගහනයක මධ්‍යනා‍ය වයස සහ මධ්‍යස්ථ වයස
II. උපතේදී පුම්තිරි අනුපාතය සහ සමස්ත පුම්තිරි අනුපාතය
III. විඵලතාවය සහ වන්ධ්‍යාභාවය
IV. මාතෘ මරණ අනුපාතය සහ මාතෘ මරණ අනුපාතිකය
V. ආගමනය සහ විගමනය

(ලකුණු 04x5 = 20)